# FREEDOM DEFENDERS - SRI LANKA

109/8, Kahatagaha Watta Mw, Dampe Rd, Madapatha, Piliyandala. SRI LANKA 10306

Email : freedomdefenderssl@gmail.com, Mobile – (+94) 77 3083479


2026.09.09

ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
බත්තරමුල්ල.

ගරු ලේකම්තුමනි,

**<u>නීතිඥ අවලා සෙනවිරත්න සහ ඇයගේ වින්දිත සේවාදායකයෙකු අනීතික ලෙස අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් රජයට බලවත් අප්‍රසාදය පල කිරීම</u>**

*"නීතිඥ අවලා සෙනවිරත්න මෙලෙස අනීතික ලෙස අත්අඩංගුවට ගැනීමට කට යුතු කිරීමෙන් පෙනී යන්නේ ජනාධිපති අනුර කුමාර යටතේ එම කළු රාජ්‍ය රාජපක්ෂලා බලයේ සිටි කාලයටත් වඩා ශක්තිමත්ව හා නොබියව ක්‍රියාත්මක වන බවයි."*

**<u>සිදුවීමේ පසුබිම</u>**

2026.01.27 වනදා නීතිඥ අවලා සෙනවිරත්න යන අය අපරාධයක වින්දිතයෙකු (පැමිණිල්ල) වෙනුවෙන් පෙනී සිටීමට ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ගොස් ඇති අතර, එහිදී අදාළ නඩුවේ පැමිණිල්ල නියෝජනය කළ යුතු වින්දිතයන් ආරක්ෂා කිරීමේ අධිකාරියේ නිලධාරියෙකු වන <u>පොලිස් පරීක්ෂක දසනායක ආරච්චිගේ නිශසන් අරවින්ද දසනායක</u> යන අය නීතිපතිවරයා ඔවුන් වෙත ලබා දී තිබූ උපදෙස් ගෙන පැමිණ සිට ඇති අතර, එකී උපදෙස් පත්‍රිකාව සහිත වැඩිදුර වාර්තාව අධිකරණයට ඉදිරිපත් කිරීමේ තම <u>රාජකාරිය ඉක්මවා ගොස්</u> එකී නිලධාරියා විසින් එකී පැමිණිල්ලට විරුද්ධව අසත්‍ය කරුණු අධිකරණයට ප්‍රකාශ කරමින්, පැමිණිලිකාර වින්දිතයා වෙනුවෙන් නීතියට අනුකූලව නීතිඥ අවලා විසින් කරන ලද <u>වාචික කරුණු දැක්වීම් වලට බාධා කරමින් ඒවා විවේචනය කරමින් නීතිඥවරියට මානසිකව අඩත්තේට්ටම් කරමින් සහ වින්දිතයාට යුක්තිය ඉටු කර ගැනීමට අගතිගාමී වන ලෙස කටයුතු කර ඇත</u>. ඒ අනුව ඔහුගේ එකී ක්‍රියාව අතරතුර අධිකරණය නඩු කටයුත්ත අවසන් කර ඇත.

එම අධිකරණ කටයුත්ත අවසන් වූ පසු අදාළ වින්දිතයා එම පොලිස් පරීක්ෂක දසනායක යන අයගෙන් අධිකරණයට සාවද්‍ය කරුණු දැක්වූයේ ඇයිද යන්න ප්‍රශ්න කර ඇත. එහිදී ඔහු විසින් වින්දිතයාට සහ නීතීඥවරියට විරුද්ධව පැමිණිලි කරන බවට අනියමින් තර්ජනය කර ඇත.

**<u>මුල් පැමිණිල්ල හා සිදුවීමේ හඬපටය</u>**

එම සිදුවීමෙන් පසු එදිනම එනම් 2026.01.27 වන දින උදෑසන නීතිඥ අවලා සෙනවිරත්න හා එම වින්දිතයා ප්‍රදේශය භාර පොලිස් අධිකාරි කාර්යාලයේ අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත IIB 389/201 , IIB 395/202 යටතේ තමාට අදාළ දසනායක නම් නිලධාරියාගෙන් සිදු වූ අපරාධ වැරදි සම්බන්ධයෙන් වෙන වෙනම පැමිණිලි 2 ක් ඉදිරිපත් කර ඇත. එසේම එදිනම වරාය පොලිසියේ ස්ථානාධිපතිවරයාට දුරකථනයෙන් කතා කොට <u>සිදු වූ සිදු වීම පැහැදිලි කර ඇති අතර, තම ජංගම දුරකථනයක අදාළ නිලධාරියා සමඟ ඇති වූ සම්පූර්ණ සංවාදය පටි ගත</u>

වී ඇති බවද දන්වා ඇති අතර, ඊට අදාළව ප්‍රකාශයක් සටහන් කර ගැනීමට අවශ්‍ය නම් පැමිණිය හැකි බවද දන්වා ඇත. එම නිලධාරියා සමඟ ඇතිවූ සංවාද හඬපටයේ සංවාදය යතුරු කිරීමක් (transcript) මේ සමඟ මා අමුණා ඉදිරිපත් කරමි.

ඉන්පසු, පොලිස් පරීක්ෂක දසනායක යන අය නීතිඥ අවලා සෙනවිරත්න හා එම වින්දිතයා තමන්ට තර්ජනය කර බවත්, රාජකාරියට බාධා කල බවත් පවසා පැමිණිල්ලක් ත්‍රිකුණාමලය වරාය පොලිසිය වෙත  කර ඇත. එම පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් නොපවත්වා ඉන් පසුදාම එනම්, 2026/01/28 දින ත්‍රිකුණාමලය වරාය පොලිසිය විසින් නීතිඥ අවලා හා එම වින්දිතයා සැකකරුවන් ලෙස නම් කර ගරු අධිකරණයට BR/146/01/PC/26 යටතේ කරුණු වාර්තා කර ඇත.

## CCTV දර්ශන ලීක් වීම

මෙම සිදුවීමට අදාළ අධිකරණයේ CCTV දර්ශන අනීතික ලෙස සමාජ මාධ්‍ය වෙත පොලිසිය පාර්ශ්වයෙන් මුදාහැර ඇති අතර, එහිදී එය ඉදිරිපත් කර තිබුනේ නීතිඥ අවලා හා වින්දිතයා පොලිස් නිලධාරියෙකුට පහර දීමට තැත් කිරීමක් යන සාවද්‍ය චෝදනාවක් යටතේ ය. එම CCTV දර්ශන තුල බැලුබැල්මට එවැනි දෙයක් හෝ අදාළ පොලිස් පරීක්ෂක දසනායක යන අය චෝදනා කරන ආකාරයෙ දෙයක් දක්නට නොලැබුණු අතර, එම අනීතික හා කුමන්ත්‍රණකාරී තත්ත්වය පිළිබඳව මා විසින් 2026.02.08 දින පැමිණිල්ලක් පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. ඊට අදාළව විමර්ශනයක් පොලිස් විශේෂ විමර්ශන ඒකකයේ (SIU) ආරම්භ කරන ලදී.

## නිලධාරියා නිදහස්

එසේ නමුත්, නීතිඥ අවලා කරන ලද  පැමිණිල්ල සම්බන්ධයෙන් මේ වනතෙක් කිසිදු පියවරක් ගෙන නැති අතර, එම වින්දිතයා විසින් අදාළ දසනායක නම් නිලධාරියාට එරෙහිව පොලිස් අධිකාරී කාර්යාලයේ අපරාධ විමර්ශන කොට්ඨාසයේ කරන ලද පැමිණිල්ලෙන් 20%ක පමණ ප්‍රමාණයක් ඇතුළත් කර ඒ සම්බන්ධයෙන් ත්‍රිකුණාමලය වරාය පොලිසිය අධිකරණයට BR/236/01/PC/26 යටතේ කරුණු වාර්තා කිරීමට කටයුතු කර ඇති අතර, එසේ කර ඇත්තේ එම පැමිණිල්ලේ කරුණු යටපත් කරමින් ය.

පසුව එම වින්දිතයා අදාළ නිලධාරියාට එරෙහිව කරන ලද පැමිණිල්ලේ විමර්ශනයේදී එම ස්ථානයේ සිටි නීතිඥයින් කීප දෙනෙකුගෙන් පොලිසිය ප්‍රකාශ ලබා ගෙන ඇති අතර, ඔවුන්ට අනුව කිසිදු තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් කරුණු අනාවරණය නොවන නිසා යැයි කියමින්, පොලිස්පති යටතේ විශේෂ විමර්ශන ඒකකයේ සිදුවන විමර්ශන සම්බන්ධයෙන් ද කරුණු සඟවමින් අදාළ දසනායක නම් නිලධාරියා BR/236/01/PC/26 නඩුවෙන් නිදහස් කිරීමට ත්‍රිකුණාමලය වරාය පොලිසිය ගරු අධිකරණය හරහා කටයුතු කර ඇත.

මෙම BR/146/01/PC/26, BR/236/01/PC/26 දරණ නඩුකර දෙක 2026/09/02 දින කැඳවීමට නියමිතව තිබුනද, එකී පොලිස් නිලධාරියාට එරෙහිව BR/236/01/PC/26 යටතේ පැවරූ නඩුව ඉහත සඳහන් ආකාරයෙන් පැමිණිල්ලට නොදන්වා 2026/08/19 දින ඒකපාර්ශ්විකව අවසන් කොට ඇත.

**ප්‍රකාශ නොමැති නඩුව**

එකී පසුබිමක, 2026.09.02 දින නීතිඥ අචලා සෙනවිරත්න හා වින්දිතයා ඔවුන්ට එරෙහිව පවරා ඇති BR/146/01/PC/26 නඩුවට පෙනීසිට ඇත. එහිදී විමර්ශනයක් හෝ ප්‍රකාශ ලබා ගැනීමකින් තොරව ඔවුන්ව සැකකරුවන් කර ඇත්තේ කෙසේද යන්න අධිකරණයේ වැඩ බලන මහේස්ත්‍රාත් විමසා ඇත. ඔවුන්ට ප්‍රකාශ ලබාදීමට අධිකරණය උපදෙස් ලබා දී ඇත.

**අත්අඩංගුවට ගැනීම**

ඉන්පසු 2026.09.03 දින, වරාය පොලිසියට ගොස් ප්‍රකාශ ලබා දී අවසන් කිරීමටත් පෙර, කිසිදු සාක්ෂියකින් හෝ නිසි විමර්ශනයකින් තොරව  නීතිඥ අචලා හා වින්දිතයා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. උදෑසන 9.00 සිට සවස 3.00 දක්වා පොලිසියේ රඳවා ගැනීමෙන් පසුව, ඔවුන් ත්‍රිකුණාමලය අධිකරණයට ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී ඇප ලබාදීමට පොලිසිය විරුද්ධ වී ඇති නමුත් ත්‍රිකුණාමලය  අතිරේක මහේස්ත්‍රාත්වරයා  ඔවුන්ට ඇප ලබාදීමට කටයුතු කර ඇත.

**එකම සිදුවීමේ පදනම් දෙකක්**

නීතිඥ අචලා හා වින්දිතයා ගොනු කර ඇති පැමිණිල්ලට අදාළව CCTV දර්ශන අනුව මුලින්ම ඇඟිල්ල දිගු කරන්නේ පොලිස් නිලධාරියා කියා දැන දැනම, එම ස්ථානයේ සිටි නීතිඥයින් කීප දෙනෙකුගේ ප්‍රකාශ අනුව කිසිදු තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් කරුණු අනාවරණය නොවන නිසා යැයි කියමින් අදාළ නිලධාරියා නිදහස් කිරීමට කටයුතු කල වරාය පොලිසියම, ඉන්පසු එම CCTV දර්ශන අනුවම කිසිදු බාධා කිරීමක්, තර්ජනය කිරීමක් හෝ අනීතික ක්‍රියාවක් සිදු නොවන බවට පෙනෙන්නට තිබියදී, අදාල සංවාදයේ හඬ පටය සම්බන්ධයෙන් ද විමසීමක් නොකොට, 2026.01.27 දින සිදුවීමට අදාළව පොලිස් නිලධාරියා විසින් ගොනු කර ඇති  සම්පූර්ණයෙන් සාවද්‍ය පැමිණිල්ල මත පමණක් පිහිටා  නීතිඥ අචලා හා වින්දිතයා අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම හා ඉන් පසු අධිකරණයට ඉදිරිපත් කර ඇප ලබාදීමට විරුද්ධ වීම ද, කුමන්ත්‍රණකාරී මෙන්ම අන්ත දූෂිත හා අනීතික ක්‍රියාවලියක් ලෙස මම දකිමි. ඉන් නීතිඥ අචලා සෙනවිරත්නට එරෙහිව යන කුමන්ත්‍රණයේ ප්‍රහලත්වයද පැහැදිලිව පෙන්නුම් කරති.

**පැමිණිලිවලට යුක්තිය කෝ?**

මේ සිදුවීම් සම්බන්ධයෙන් ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති මහින්ද දිසානායක යන අයව දැනුවත් කිරීමට නීතිඥ අචලා කටයුතු කරන ලදී. ඊට අමතරව නීතිඥ අචලා සෙනවිරත්න විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව, අධිකරණ සේවා කොමිෂන් සභාව, ගරු අගවිනිසුරුතුමා වෙත පැමිණිලි ඉදිරිපත් කලද, ඉන් කිසිදු සාධනීය විමර්ශනයක් සිදුවී නැත.

මෙම සිද්ධිය සිදු වූ වහාම නීතිඥ සංගමය දැනුවත් කිරීමට නීතිඥ අචලා සෙනවිරත්න කටයුතු කලද, ඔවුන් ද මෙතෙක් මැදහත් වීමක් කර නොමැත.

**වින්දිතයන් චූදිතයන් වීම**

නීතිඥ අචලා සෙනවිරත්න යනු 2019 වසරේ සිටම වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත ප්‍රකාරව ආරක්ෂාව ලැබීමට නියම කර ඇති නීතිඥවරියකි. අදාළ සේවාදායකයා ද වින්දිතයන් ආරක්ෂා කිරීමේ විධිවිධාන ප්‍රකාරව වින්දිතයෙක් හා රැකවරණය ලබන අයෙකි.

**පොලිසිය කළු රාජ්‍යයක් ද?**

ශ්‍රී ලංකා පොලිසියේ දූෂිත ක්‍රියාකාරකම් වලට හා කළු රාජ්‍යයේ දූෂිත ක්‍රියාවලියන්ට එරෙහිව කටයුතු කරන නීතිඥ අචලා සෙනවිරත්න සම්බන්ධ වන මෙම සිදුවීම ගැන :

- ගරු අධිකරණය CCTV පද්ධතියේ දර්ශන අසත්‍ය කරුණු සහිතව, නිර්නාමිකව, සමාජ මාධ්‍ය වෙත නිකුත් කිරීම තුළ ඇය ඉලක්ක කර කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වී තිබෙන බවට පැහැදිලි කරුණු ද තිබියදී,

- එම නිලධාරියා සමඟ ඇති වූ සංවාදයේ හඬපටය ද තිබිය දී, ඒ හරහා එම නිලධාරියා සිදු කර ඇත්තේ සම්පූර්ණයෙන්ම සාවද්‍ය හා ද්වේශ සහගත පැමිණිල්ලක් බවට බැලුබැල්මට ඔප්පු කිරීමට කරුණු තිබය දී,

- අදාළ සිදුවීම සම්බන්ධයෙන් පොලිපති යටතේ ද විශේෂ විමර්ශනයක් සිදු වන බවට පැහැදිලි සාක්ෂි තිබියදී,

ඒවා සියල්ල නොසලකා හැර, ශ්‍රී ලංකා පොලිසිය විසින්

- 2026.09.03 දින නීතිඥ අචලා සෙනවිරත්න අත්අඩංගුවට ගැනීම හා

- ඇප ලබාදීමට විරුද්ධ වීම

තුලින් පෙන්නුම් කරන්නේ රට තුල පවතින කළු රාජ්‍ය (පාතාල රාජ්‍ය/අපරාධ රාජ්‍ය) ශ්‍රී ලංකා පොලිසිය තුල එළිපිට ක්‍රියාත්මක වන බවයි. ඒ අනුව, රථවාහන නැවතුමක් හරහා මා වැනි අය ද ඔවුන්ගේ ඊළඟ ඉලක්කය වීමට හැකියාවක් ඇත.

මෙහි බරපතළම කරුණ වන්නේ මෙම කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙළට සම්බන්ධ වන අදාළ පොලිස් නිලධාරියා වින්දිතීන් ආරක්ෂා කිරීමේ අධිකාරියේ කොටසක් වීමයි.


**ආණ්ඩුවේ අසාර්ථක බවද? නැතිනම් කළු රාජ්‍යයේ මෙහෙයවන්නන් ද?**

කළු රාජ්‍ය (පාතාල රාජ්‍ය/අපරාධ රාජ්‍ය) මෙහෙයවූ රාජපක්ෂලා බලයේ සිටින කාලයදී වත් එයට එරෙහිව නැගී සිටි නීතිඥ අචලා සෙනවිරත්න අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ තත්ත්වයකදී, එම කළු රාජ්‍යයට එරෙහිව අතිගරු ජනාධිපතිවරයා කටයුතු කරන බවට මාධ්‍ය ඉදිරියේ පුරසාරම් දොඩවන පසුබිමක, අතිගරු ජනාධිපතිවරයා යටතේ ඇති පොලිසියම නීතිඥ අචලා සෙනවිරත්නව මෙලෙස අනීතිකව හා කුමන්ත්‍රණකාරී ලෙස අත්අඩංගුවට ගැනීමට කට

යුතු කිරීමෙන් පෙනී යන්නේ ජනාධිපති අනුර කුමාර යටතේ එම කළු රාජ්‍ය රාජපක්ෂලා බලයේ සිටි කාලයටත් වඩා ශක්තිමත්ව හා නොබියව ක්‍රියාත්මක වන බවයි. ඒ අනුව, ජනාධිපති අනුර යටතේ එම කළු රාජ්‍ය වෙනදාටත් වඩා රැකවරණය ලබන බවයි.

ඒ අනුව, මෙම සිදුවීම සම්බන්ධයෙන් මාගේ බලවත් අප්‍රසාදය හා විරෝධය මින් ප්‍රකාශ කර සිටිමි.

මෙයට විශ්වාසී,



..............................................................

විරන්ත අමරසිංහ

**සභාපති - නිදහස සුරකින්නෝ සංවිධානය**

පිටපත්:

- කොළඹ අගරදගුරු - අතිඋතුම් මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන්
- ලේකම් - අධිකරණ සේවා කොමිෂන් සභාව
- ලේකම් - ජාතික පොලිස් කොමිෂන් සභාව
- ජනාධිපති ලේකම්
- අග්‍රාමාත්‍ය ලේකම්
- පොලිස්පති - ශ්‍රී ලංකා පොලිසිය
- සියලුම මාධ්‍ය ආයතන

**2026/01/27 දිනැතිව දුරකථනය මගින් පටිගත කරන ලද නීතිඥ අචලා සෙනෙවිරත්න , මේජර් අර්සාත් සහ පොලිස් පරික්ෂක දසනායක යන අය විසින් සිදු කළ බව කියන තප්පර 41 ක සංවාදය.**

නීතිඥ අචලා ( අගතියටපත් පාර්ශවයේ නීතිඥ): දැන් මතක නැහැ

මේජර් අර්සාත් (අගතියටපත් පාර්ශවකරු) : ඇයි බොරු කියන්නේ?

පොලිස්පරික්ෂක දසනායක - ආ...

මේජර් අර්සාත් (අගතියටපත් පාර්ශවකරු) : අධිකරණයට

නීතිඥ අචලා ( අගතියටපත් පාර්ශවයේ නීතිඥ): මෙ.....2020...දැන් ඕන නැ.වැඩක් නෑ කතා කරලා

මේජර් අර්සාත් (අගතියටපත් පාර්ශවකරු) : මම කම්පේලේන් කළේ 2020.ඇයි බොරු කිව්වේ.පගාවක් ගත්තද? පගාවක් ගත්තද?

( ඒ දෙබස අතර

නීතිඥ අචලා ( අගතියටපත් පාර්ශවයේ නීතිඥ): නොදන්න දේවල් ඇයි කියන්නේ?

පොලිස්පරික්ෂක දසනායක : ( කතා කරන දේ පැහැදිලි නැත.)

මේජර් අර්සාත් (අගතියටපත් පාර්ශවකරු) : ඇයි බොරු කිව්වේ උසාවියට?උසාවියට ඇයි බොරු කිව්වේ.?

පොලිස්පරික්ෂක දසනායක : මම කම්පේලේන් කරනවා.



CamScanner

නීතිඥ අවලා ( අගතියටපත් පාර්ශවයේ නීතිඥ): දැන් ඕන නැහැ දැන් වැඩක් නෑ.

පොලිස්පරික්ෂක දසනායක : කම්පේලේන් කරනවා

මේජර් අර්සාත් (අගතියටපත් පාර්ශවකරු) : කම්පේලේන් කරන්න.මාත් කම්පේලේන් කරනවා.ඔයා පගාවක් ගත්තද? ඇයි බොරු කිව්වේ උසාවියට? උසාවියට ඇයි බොරු කිව්වේ?

නීතිඥ අවලා ( අගතියටපත් පාර්ශවයේ නීතිඥ) : ඇති ඇති නවත්තන්න ඔය කතාව

පොලිස්පරික්ෂක දසනායක : උසාවියට කරුණු වාර්තා කරලා තියෙන්නේ.

මේජර් අර්සාත් (අගතියටපත් පාර්ශවකරු) : මම කම්පේලේන් කරලා තියෙන්නේ 2020

පොලිස්පරික්ෂක දසනායක : ඒක කමක් නැහැ. ඔයා ඕන එකක් කරගන්න.මම යනවා කම්පේලේන් කරන්න.

මේජර් අර්සාත් (අගතියටපත් පාර්ශවකරු) : මාත් කම්පේලේන් කරනවා යං

ඉහත සඳහන් සංවාදය මා පුද්ගලිකව හොඳින් සවන් දී එකී සංවාදය ඒ අකාරයෙන්ම ලිඛිතව මෙහි පිටපත් කළ බව සහතික කරමි.

අත්සන

A. Ramzy 2026.03.09

A. L. M. Ramzy (Naleemi) BA. Dip.in journalism
Sworn Translator (Sinhala / Tamil)
Regd. No: 2022/ST/KU/003
No. 362/1, Godakurugama, Thuththiripitigama.
T.P. 077 038 7313



CamScanner